**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.1.2.1 (අ) ඡේදය | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයන් අනුව රු.37,967,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ දෙපාර්තමේන්තුව සතුව පවතින බව දක්වා තිබුණද, රු.12,900,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 05 ක්ද ඒ තුළ ඇතුලත්ව තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාව පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි බැවින් ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු බව. | 1.6.1.(අ) (i) ඡේදය |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් රු.74,767,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 කට අදාල රු.10,700,000 වටිනාකමද ඇතුලත් බව අනාවරණය විය. | වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 හි අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ වත්කම් චක්‍රලේඛ අංක 03/2018 ට අනුව 2022 නොවැම්බර් 22 දින අදාල ලිපි ලේඛන භාරදී ඇත. | භාවිතා කරනු ලබන වෙනත් ආයතනවලට අයත් වත්කම් විධිමත් පරිදි පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතුය. |
| (ii) | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුදල් මගින් මිලදීගෙන නගර සැළසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ එකතුව රු.13,984,000 ක් වටිනා යතුරුපැදි 64ක් 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ අතර විගණන දිනය වූ 2023 මාර්තු 23 දින වන විටත් එම යතුරුපැදිවල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් දැනට යතුරු පැදි 53 ක ලියාපදිංචි සහතික දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. | මෙම යතුරුපැදිවල අයිතිය පවරා ගැනිමට සහ ඒ පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික හදිසි ළමා අරමුදල (UNICEF) මගින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබූ මූල්‍ය ප්‍රදානවලට අදාල රු.1,000,000 ක වාර්ෂික ප්‍රතිපාදන සහ රු.2,696,000 ක් වූ අතිරේක ප්‍රතිපාදනවලින් වර්ෂය තුල රු.1,375,552 ක් එනම් සියයට 37 ක් පමණක් වැයකර තිබුණි. | 2022 වර්ෂයේ රු.2,696,000 ප්‍රතිපාදන යුනිසෙෆ් වැඩසටහන සඳහා වෙන්වූ අතර, 2022 දෙසැම්බර් 31 වන විට වැඩ අවසන් කර බිල්පත් ලැබී තිබූ ව්‍යාපෘති සඳහා රු.375,552 ක මුදල ගෙවා ඇත. | විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මෙවැනි අරමුදල් තුලින් ප්‍රතිලාභ හිමිවිය යුතු පාර්ශවයන්ට අදාල ප්‍රතිලාභ කඩිනමින් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර අකාර්යක්ෂමතාවයන් වලක්වා ගැනීමට ක්‍රමවේදයක් සකස් විය යුතුය. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර ඇති අතර, මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී නිරන්තරයෙන් සමාලෝචනයට භාජනය කෙරේ. | විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.7 ඡේදයේ දක්වා ඇති පරිදි 2022 මාර්තු මස නිකුත් කරන ලද විගණන විමසුමකට පිළිතුරු ලබා දී නොතිබුණි. | පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසුව පිළිතුර ඉදිරිපත් කරමි. | විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | මෙම අංශයට අනුයුක්ත කරනු ලැබූ ගණකාධිකාරීවරිය දේශීය නිවාඩු ලබා ගැනීම නිසා ඒ සඳහා නිලධාරියෙකු මේ දක්වා පත්කර එවා නොමැති අතර අමාත්‍යාංශයේ විගණන අංශයෙන් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි. | ජාතික විගණන පනතෙහි දක්වා ඇති විධිවිධාන පරිදි මෙන්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය පිළිබඳ සලකා බැලීමේදී අභ්‍යන්තර විගණන ඒකකයක අවශ්‍යතාවය දැඩිව පවතින බැවින් සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් කඩිනමින් ස්ථාපිත කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| 751(1),752, 763 | 220,169,400 | ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සඳහා මිලදීගෙන | ඉදිරියේදී සියළුම ලැබීම් තොග | දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන බෙදාහරිනු ලබන උපකරණ හා උපාංග පිළිබඳ |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රජාමූල සංවිධාන වෙත බෙදාහැර තිබූ ජල පොම්ප හා උපාංග සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ ජල මීටර් 2,543 ක් පිළිබඳ තොරතුරු බඩු ලේඛණ පොත්වලට ඇතුලත් කර නොතිබුණි. | පොත්වලට සටහන් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු අතර දැනට ගබඩා තුල ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර සියලුම උපකරණවල භෞතික පැවැත්ම පිළිබඳ තහවුරුවක් ලබාගෙන ඌණතා අතිරික්තතා පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006**<br>4.1හා 4.4 ඡේද | 68,097,893 | පාරවල්, ජලාපවහන, ඇලවල් ආදියේ කොන්ත්‍රාත් දේශීය ලංසු කරුවන් විසින් ඉටු කළ හැකි වන පරිදි තනි ගොනුවලට බෙදා එකම වේලාවක ගොනු බොහොමයක් සඳහා ලංසු කැඳවිය යුතු වුවත් මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය අදියර 10 කට බෙදා අවස්ථා කිහිපයකදී ප්‍රජා මූල සංවිධාන 02 කට හා පුද්ගලික ආයතන 03 කට ලබා දීමට කටයුතු කර තිබුණි. | ඇස්තමේන්තුවේ සඳහන් මුළු ප්‍රතිපාදනයම වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන සීමාවට යටත්ව එක් එක් අදියරේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත. අදාල ප්‍රජා මූල සංවිධානයට තාක්ෂණික ශක්‍යතාවය නොමැති අයිතම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව තරගකාරී මිල ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව වඩාත් ඵලදායී ක්‍රමවේදයකට අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගතයුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 ජනවාරි 05 හා 2021 සැප්තැම්බර් 29 දිනැති පිළිවෙලින් අංක 01/2012 හා 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැවරිය යුතු වුවද, විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාව සඳහා පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය පැවරීමේදී එවැනි ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශ මත සිදුකර නොතිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් මඟින් එම කටයුත්ත ආරම්භ කර තිබුණද, අපේක්ෂිත අරමුණට ලඟාවිය නොහැකිව ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | 2021 වර්ෂයේ සිට ප්‍රජා මූල සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, අදාළ ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ ලබන සංවිධානය සඳහා පමණක් කොන්ත්‍රාත් පිරිනමා ඇත. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු එහි නඩත්තු හා මෙහෙයුම් කටයුතු බාර දෙනු ලබන්නේ අදාල ප්‍රජා මූල සංවිධානය වෙතටමය. රු.මිලියන 5 ට අඩු වටිනාකමින් යුත් ව්‍යාපෘති එම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රජා මූල සංවිධානයටම ලබා දෙන බැවින් හා වෙනත් සංවිධාන වලින් ද මිල ගනන් ලබා ගනිමින් සංසන්දනයක් නොකෙරෙන බැවින් කමිටුවක ඇගයීමට ලක් කිරීම සිදු නොවේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධානයේ යෝග්‍යතාවය තහවුරු කර කොන්ත්‍රාත්තු පැවරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මොණරාගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති 04 කට අදාළව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල ඇතුළත් කාර්යයන් 84 ක කිසිදු ඉදිකිරීමක් සිදු නොකර තිබියදී එකතුව රු.2,195,071 ක් සහ අඩක් නිමකළ හෝ ප්‍රමාණපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව සිදුකළ ඉදිකිරීම් කාර්යයන් 17 ක් වෙනුවෙන් එකතුව රු.777,347 ක් දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ සහතිකය මත ගෙවා තිබුණි. තවත් එක් ව්‍යාපෘතියක් සඳහා රු.3,929,236 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඊට අදාළව කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර 2023 මාර්තු වන විට එම ඉහත ව්‍යාපෘති සියල්ලම අතරමග අත්හැර දමා තිබුණි. ඒ අනුව ඒ සඳහා වැය කර තිබූ | මෙම ව්‍යාපෘතිය අතරමග නවතා දමා නොමැති අතර, මේ වන විට අදාළ කාර්ය සාධන ඇපකර සහ අත්තිකාරම් ඇපකර දීර්ඝ කර වැඩ කටයුතු කරමින් පවතී. බිල්පත් ගෙවීමේ ගැටළුව පිළිබඳ තවදුරටත් සොයා බලා වාර්තාවක් පසුව ඉදිරිපත් කරමි. | මෙම කොන්ත්‍රාත් කටයුතු පිළිබද නිසි අධීක්ෂණයකින් තොරව ගෙවීම් සහතික කිරීම, ගෙවීම් කිරීම හේතුවෙන් රජයට පාඩු සිදු වී ඇති බව නිරීක්ෂණය වන බැවින් ඊට අදාල වගකිවයුත්තන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.17,730,116 ක මුදල නිශ්කාර්ය වැයක් බවට පත්වෙමින් තිබුණි. | | |
| (ඇ) | මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 5 ක කැණීම් ළිං 04 ක් හා ජල ටැංකියක් ඉදිකිරීම සඳහා ලබා දී තිබුණු කොන්ත්‍රාත්වල කාර්යයන් කිහිපයක් ඉටු කිරීම පිළිබද සාක්ෂි හෝ තහවුරු නොමැතිව රු.295,000 ක් සහ ඉටු නොකළ වැඩ සඳහා සහ කළ වැඩ ප්‍රමාණය ඉක්මවා වැඩිපුර ගෙවීම් කිරීම වෙනුවෙන් රු.4,148,606 ක් රජයේ මුදල් නිෂ්කාර්ය ලෙස වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අදාල ස්ථානවල ජල තත්ත්වය පරීක්ෂාව ඇතුළත්ව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබූ අතර ඉදිකර අවසන් කර තිබූ ළිං 03 ක ජලයෙහි තත්ත්වය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මෙන්ම පරිභරණයට නුසුදුසු බව ජල නියැදි පරීක්ෂාවලදී තහවුරු වී තිබුණි. ඒ අනුව මෙම ජල සම්පාදනවලට අදාල නිළධාරීන් ඉතාමත් නොසැලකිල්ලෙන් රජයට පාඩු සිදුවන පරිදි කටයුතු කර ඇතිබව අනාවරණය වී තිබුණි. | මෙම බිල්පත් ගෙවීමට පෙර අදාළ ඉදිකිරීම් වල ඡායාරූප පරීක්ෂා කර ගෙවීම සිදුකර ඇති අතර, ගැටළුව පිළිබඳව තවදුරටත් සොයා බලා වාර්තාවක් පසුව ඉදිරිපත් කරමි. | නිළධාරීන්ගේ නොසැලකිලිමත්කමින් මෙම කොන්ත්‍රාත් කාර්යයේදී රජයට පාඩු සිදුවී ඇති බව විගණන පරීක්ෂාවලදි අනාවරණය වී ඇති බැවින් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය. එමෙන්ම මෙම ඉදිකිරීම් කඩිනම් කර එම ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටුකරදිමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, ඉහත කී පරිදි විධිමත් නෛතික පසුබිමක් නොමැතිව ප්‍රජා මූල සංවිධාන 4530 කට ආසන්න සංඛ්‍යාවක් ලියාපදිංචි කර සහතික නිකුත්කිරීම සහ මාසිකව ගාස්තු අයකිරීම වැනි කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකරමින් පැවතුණි. | දෙපාර්තමේන්තුව මැදිහත්ව සියළු පාර්ශවකරුවන් සම්බන්ධ කරගන්මින් මේ වන විට පනත සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. මේ වන විට අවසන් කෙටුම්පත සකස් කර ඒ සඳහා නිරීක්ෂණ සකස්කර කඩිනමින් යොමු කිරීමට කටයුතු කෙරේ. | පනත සම්මත කර ගැනීම කඩිනමින් සිදු කලයුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීමේ අරමුණින් Nano Filters 80 ක් ඉදිකර ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර ඉන් විගණන දිනය වූ 2022 දෙසැම්බර් 31 වන විට 25 ක් පමනක් ඉදිකර අවසන් කර තිබුණු අතර එදින වන විට එකතුව රු.120,718,050 ක් වැය කර තිබුණි.මීට අදාලව මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ Nano Filters 05 ක් පිළිබඳ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමෙන් තොරව ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණද ඊට අදාලව ප්‍රමාද ගාස්තු අය කිරීමට සහ කාර්යසාධන ඇපකර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබීම, ඉදිකිරීම්වලට අදාල අනුමත ප්‍රමානපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව ඉදිකිරීම් සිදුකර තිබියදී තාක්ෂණික නිලධාරීන් ලබා දුන් ව්‍යාජ සහතික මත එකතුව රු.7,385,602 ක මුදලක් ගෙවා තිබීම වැනි අඩුපාඩු සිදුවී තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ප්‍රතිපාදන මත Nano Filter 80 න් 50 ක වැඩ මේ වන විට අවසන් වී ඇත. ඉතිරි 30 සඳහා 2021 සැප්තැම්බර් 15 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර කාර්ය සාධන ඇපකර අදාල ආයතනය විසින් දීර්ඝ කර මේ වන විට වැඩ කටයුතු සිදුකරමින් පවතී. ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සිදුකර නොමැති අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති සැලසුම සහ ලංසු ලේඛන වල සඳහන් සැලසුම අතර තිබූ පරස්පරතාවයන් නිසා මෙම වෙනස්කම් සිදුවී ඇති අතර, මේ වන විට ඉදිකිරීම්, අනුමත සැලසුමට අනුව සකස් කර ඇත. | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල පැවති අවිධිමත්භාවය හා නිළධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් රජයට පාඩු සිදුවීම මෙන්ම එම කටයුත්ත නිසි ප්‍රමිතියකින් සිදුනොකිරීමෙන් ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවගේ අවශ්‍යතාව ඉටුනොවීම පිළිබඳ විගණන පරීක්ෂණවලින් අනාවරණය වී තිබූ කරුණු පිළිබද කළමනාකරණය දැනුවත් කර ඇති බැවින් ඒ පිළිබද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ට අදාලව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කලයුතු අතර ඉදිකිරීම් අතරමග නවතා ඇති කොන්ත්‍රාත් කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | එකතුව රු.183,600 ක් වැයකරමින් මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 4 ක නල ළිං 4 ක් ඉදිකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් භූ විද්‍යාත්මක පරීක්ෂණ සිදුකර 2021 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබූ අතර විගණන දිනය වූ 2023 මාර්තු වන විට එකතුව රු.1,260,058 ක් වැයකර ඉන් ළිං 02 ක් පමණක් ඉදිකර තිබුණි. ඉදිකල නල ළිං මගින් ජලය බෙදාහැරීමේ | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය විසින් මෙම නල ළිං සඳහා ලබාදී තිබූ ඇස්තමේන්තු අනුව ඉදිකිරීම් සිදුකර ඇත. නමුත් ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීමට තිබියදී ලබාදී තිබූ ඇස්තමේන්තු තාවකාලිකව අවලංගු කරන බව දැන්වීම මත | මෙම අවිධිමත් කොන්ත්‍රාත් කාර්යය හේතුවෙන් සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නල ළිං 04 හි ඉදිකිරීම් කඩිනමින් නිමකර ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින ජනතාවට එම සේවාව ලබා දිය යුතුය. |

| | | |
|---|---|---|
| කටයුත්තද දෙපාර්තමේන්තුව මගින් සිදුකර නොතිබුණි. ඒ අනුව ඉහත භූ විද්‍යාත්මක පර්යේෂණ සඳහා වැය කර තිබූ රු.183,600 ක මුදල ඇතුළුව මෙම කටයුත්ත සඳහා වැය කර තිබූ එකතුව රු.1,443,658 ක සම්පූර්ණ මුදල නිෂ්කාර්ය වැයක් බවට පත්වෙමින් තිබුණි. | මෙම ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීමට නොහැකි වී ඇත. මේ වන විට නව ඇස්තමේන්තු ලබාදී ඇති අතර අදාල කටයුතු සිදුකරමින් පවතී. | |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාව සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියේ කාර්යයන් 14 ක් ඉටු කිරීම වෙනුවෙන් එකතුව රු.28,530,317 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබූ අතර ඊට අයත් Pump house හා Sand filter ඉදිකිරීම 2023 පෙබරවාරි වන විටත් සිදුකර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කර විගණිත දින වන විට වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වුවද, ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ බැවින් වැය කර තිබූ රු.28,530,317 ක මුදල නිෂ්කාර්ය වැයක් බවට පත් වී තිබුණි. | විගණිත දිනය වන විට ව්‍යාපෘතිය සඳහා සිදු කර ඇති මුළු වියදම රු.27,130,316 ක් වේ. මෙම ව්‍යාපාතිය ඉදි කිරීමේදී ඇතිවූ නායයාමේ අවදානම මත අදාල නිර්දේශ ලබා ගන්නා තෙක් එම ස්ථානවලට අදාල ඉදිකිරීම් තාවකාලිකව නතර කරන ලදී. මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක තත්වයේ පවතින අතර උක්ත වියදම් මගින් සිදු කරන ලද මිලදී ගැනීම් හා ඉදිකිරීම් මෙම ව්‍යාපෘතියට අත්‍යාවශ්‍ය වේ. | විගණන නිරීක්ෂණවල සඳහන් පරිදි මෙම කොන්ත්‍රාත් කාර්යයේදී නොසැලකිලිමත්කමින් රජයට පාඩු සිදුවන පරිදි කටයුතු කිරීම සහ සේවාව අපේක්ෂිත ජනතාවට කඩිනමින් එම සේවාව නොසැපයීම පිළිබඳ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තඹාන, මොරොන්තුමුල්ල හා කොන්ගොල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ 2021 ඔක්තෝබර් 04 දින ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් 02 කට අදාළව එකතුව රු.3,929,236 ක් | විගණනය සිදුවන දිනය වන විට පොම්පාගාර වල වැඩ අවසන්ව තිබූ අතර, මුළු ව්‍යාපෘති සැලකූ විට සියයට 20 ක පමණ ප්‍රගතියක් ලබා තිබුණි. රට තුළ පැවති Covid-19 වසංගත | මෙම ව්‍යාපෘති නියමිත පරිදි සැලසුම් කර නියමිත කාලය තුළ වැඩ නිමකර ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවට |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් මුදල් ලබා දී තිබුණු අතර විගණන දිනය වූ 2022 නොවැම්බර් 25 වන විට අවස්ථා කිහිපයකදී ඉදිකිරීම් නිම කිරීම සඳහා දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණද ඉදි කිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | තත්වය සහ අමුද්‍රව්‍යවල මිල අධිකව ඉහල යෑම මත කොන්ත්‍රාත්කරු විසින් වැඩ තාවකාලිකව නවතා ඇති අතර මේ වන විට අදාල කාර්ය සාධන ඇපකර සහ අත්තිකාරම් ඇපකර දීර්ඝ කර වැඩ කටයුතු කරමින් පවතී. | එම ප්‍රතිලාභය ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.53,537,675 ක්වූ ජල ව්‍යාපෘති 4 කට අදාල කොන්ත්‍රාත් 2021 වර්ෂයේ පුද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණු අතර එම ඉදිකිරීම් වර්ෂයක පමණ කාලයකදී අවසන් කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘති වලින් එක් ව්‍යාපෘතියක පමණක් පොම්පාගාරය ඉදිකිරීම අවසන් කර තිබුණද ඉතිරි වැඩ කොටස් වසරකට අධික කාලයක සිට නිම නොකර අත්හැර දමා ඇති බව විගණනයේදි අනාවරණය වී තිබුණි. | රට තුළ පැවති Covid-19 වසංගත තත්වය සහ අමුද්‍රව්‍යවල මිල අධිකව ඉහල යෑම මත කොන්ත්‍රාත්කරු විසින් වැඩ තාවකාලිකව නවතා ඇති අතර, මේ වන විට අදාල කාර්යසාධන ඇපකර සහ අත්තිකාරම් ඇපකර දීර්ඝ කර වැඩ කටයුතු කරමින් පවතී. මෙම කොන්ත්‍රාත් අතරින් 3ක ලංසු ඉදිරිපත් කර ඇත්තේ මෙම කොන්ත්‍රාත්කරු පමණි. අනෙක් කොන්ත්‍රාත්තුව සඳහා මෙම ලංසුකරුට වඩා රු. මිලියන 5කට වැඩි ලංසුවක් ඉදිරිපත් කර ඇති නිසා මෙම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් 04 ම පිරිනමා ඇත | කොන්ත්‍රාත් පිරිනැමීමේදී කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය හා භෞතික හැකියාව මෙන්ම පූර්ව වැඩ පිළිබඳ නිසි ඇගයීමක් කල යුතුව තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් සිදුවන අතරතුර ඒ පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.4,290,300 ක් වැය කර වසරක වගකීම් කාලයක් සහිතව ජලමනු 945 ක් ක් මිලදීගෙන තිබුණු අතර විගණන දිනය වූ 2023 මාර්තු වන විට එම ජලමනු වසරකට වඩා වැඩි කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව තිබුණි. ඒ අනුව වගකීමක් සහිත මිලකට එම ජලමනු මිලදී ගැනීම ඵල රහිත වී තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා දෙවරක් ප්‍රසම්පාදන කටයුතු සිදුකළද, රට තුළ අමුද්‍රව්‍යවල මිල අධිකව ඉහළ යාම මත, කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම සඳහා සුදුසු ලංසු ඉදිරිපත් නොවී ඇත. සිවිල් ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේ අභිලාෂය ඇතිව අදාළ ජල මනු මිලදී ගැනීම සිදුකර ඇත. | අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන ප්‍රසම්පාදනය කල යුතු අතර රජයේ මුදල් ඵලදායීව යොදාගැනිම නිලධාරීන්ගේ වගකීම බව අවබෝධකර නොගෙන කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂය තුළදී දිස්ත්‍රික් 11 ක ප්‍රජා මූල සංවිධාන 151 ක් සඳහා ජල පොම්ප 161 ක් රු.192,705,000 කට ආයතන 02 කින් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 6.1.3, 6.1.4, 6.2.2, 6.3.6, 2.12(අ), 7.10.1(ආ), 7.12.4 හා 5.4.10(ආ)හි දක්වා ඇති උපදෙස්වලට පටහැනිව මෙම මිලදීගැනීම සිදුකර තිබුණු බව විගණනයේදී අනාවරණය වී තිබුණු අතර මිලදීගත් ජල පොම්පවලින් රු.18,440,600 ක් වටිනා ජල පොම්ප 14 ක් 2023 ජනවාරි 25 වන විටත් සැපයීම් කර නොතිබුණු අතර ප්‍රජා මූල සංවිධාන 02 කට ලබාදුන් රු.1,966,000 ක් වටිනා ජල පොම්ප 02 ක් වෙනුවෙන් රු.187,860 ක වැඩිපුර ගෙවීමක්ද කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ ලංසු ලේඛන e mail හරහා යොමු කරන ලදී. ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තා නිසි පරිදි ඇත. ලංසුකරුවන් අදාළ මූළ්‍ය හැකියාවන් සහ පෙර අත්දැකීම් (පොම්ප සැපයීම) ඇති බවට ලියවිලි ලංසුව සමඟ ලබා දී ඇති අතර, මේ වන විට සියළුම පොම්ප සපයා ලංසුකරුවන් සමඟ ගිවිසුම් නිසි පරිදි අත්සන් කර ඇත. ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු සාමාජිකයින්ගෙන් ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රතිඥා ලබා ගැනීම සිදුකරනු ලැබේ. | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කිරීම පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර මෙම මිලදීගැනීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කල යුතුය. |
| (ඇ) | මඩකලපුව ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 05 කට අදාලව සහ මොණරාගල ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 04 ක ට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා සියයට 24 සිට සියයට 29 ක වැඩි වටිනාකමකට කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර එසේ ඉක්මවීම් නිසා කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය වැඩිවීම්වල එකතුව රු.14,463,172ක් වී තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයේ ඇති උපදෙස් ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටු නොවන අතර ඒ සඳහා වැය කරන පිරිවැයද නිෂ්කාර්ය බවට පත්වී තිබුණි. | 2021 වර්ෂයේ මුල් කාලය තුළදී ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුමත රේටයන් (Rates) යොදා ගෙන මෙම ඇස්තමේන්තු සකස් කර ඇති අතර, 2021 වර්ෂය තුළදී රටතුළ ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හා අමුද්‍රව්‍යා මිළ ගණන් ඉහළ යාම හා භාණ්ඩ හිඟය මත මෙය සිදු වී ඇත. | කොන්ත්‍රාත් ඇගයීමේදී සහ ප්‍රදානයේදී සිදුවන මෙවැනි අක්‍රමිකතා වැළැක්වීමට හා රජයට පාඩු නොවන පරිදි කටයුතු කිරීමට කළමනාකරණ අවධානය යොමුවිය යුතුය. |
| (ඈ) | බදුලුගම්මන, බිබිල පානීය ජල ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා රු.12,209,816 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර එහි ඇතුලත් ප්‍රධාන සිවිල් වැඩ 07 හි පිරිවැය හා කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුගත පිරිවැය අතර විචලතාවය සියයට 10 ඉක්මවා තිබූ කාර්යයන් 06 ක් පැවති අතර එම එක් | 2021 වර්ෂය තුළ රට තුළ ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ අමුද්‍රව්‍යා ඉහළ යාම හා භාණ්ඩ හිඟය මත ලංසු ඉදිරිපත් කිරීමේදී ඉහළ මිළ ගණන් ලංසු කරුවන් විසින් ලංසු ලේඛන වල දක්වා ඇත.ඒ අනුව අයිතම වශයෙන් සලකා කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම අපහසු වීම මත | පවතින ආර්ථික පරිසරයට ගැලපෙන පරිදි ඉංජිනේරු ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කලයුතුව තිබුන අතර එසේ නොකර අසාමාන්‍ය වැඩි වටිනාකමකට කොන්ත්‍රාත් ප්‍රදානය |

| | | |
|---|---|---|
| එක් කාර්යයන් තුල ඇතුලත් අයිතමයන් වෙන්ව සලකා බැලීමේදී එම විචලතාවය සියයට 587 ක් දක්වා වූ ඉහළ අසාමාන්‍ය අගය පරාසයක් ගෙන තිබුණි. ලංසු ඇගයීමේදී මෙම විචලතාවය නොසලකා තිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා මිළ ගණන් වල මුළු මුදල පමණක් සලකා ඇත. | කිරීමට කටයුතු කිරීම අවිධිමත් ක්‍රමවේදයක් බව කළමණාකරන අවධානයට යොමුවිය යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොණරාගල රනුගල්ල ප්‍රදේශයේ පවුල් 500 කට ජලය සැපයීමේ දෙවන අදියර යටතේ රු.1,665,984 ක ඇස්තමේන්තු පිරිවැයකට ජල ටැංකියක් ඉදිකිරීමට සැලසුම්කර තිබු අතර රු.2,314,123 කට කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකර රු.462,824ක් අත්තිකාරම් ගෙවා තිබුණි. ටැංකිය ඉදිකිරීම තාක්ෂණික ගැටලු මත අත්හිටුවීමට 2021 නොවැම්බර්17 දින තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙහි මුල් අදියරයෙහි ඉදිකිරීම් සඳහා ඒ වන විට එකතුව රු. 6,147,244 ක්ද වැයකර තිබුණද මේ දක්වා අපේක්ෂිත අරමුණ ඉටු නොවී පැවතුනි. | මෙම ව්‍යාපෘතිය අත්හැර දමා නොමැති අතර, ප්‍රතිපාදන ලැබීමේ සීමාව මත ව්‍යාපෘතියේ මූලික අදියර 03ක් යටතේ ක්‍රියාත්මක කරයි. එම අදියරයන් සම්පූර්ණවීමෙන් පසු ජලය ලබාදීම සිදුකළ හැකි වන අතර, ඒ අනුව තෙවන අදියරේදී නළ එලීම හා මෙම ටැංකිය නිම කිරීමට සැලසුම් කර ඇති අතර, මේ වන විට ඊට අදාළව ඇස්තමේන්තු සකස් කරමින් ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් යුතුව කටයුතු කලයුතු අතර ඒ සඳහා අදාල නිලධාරීන්ගේ නිසි අධීක්ෂණය තිබිය යුතුය. එසේ කටයුතු නොකිරීමෙන් රජයට සිදුවන පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මැණික්කඩවර ජල ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.4,660,200 ක් පිරිවැය වූ ජල පොම්ප දෙකක් අදාල ව්‍යාපෘතියෙහි ස්ථාපිත නොකර ප්‍රජා මූල සංවිධානයේ ලේකම්ගේ නිවසේ තබා තිබුණි. එම පිරිවැයෙහි ඇතුලත් ජල පොම්ප සවිකිරීම සඳහා වූ රු.1,20,000 ක මුදල ජල පොම්ප සවි කිරීමකින් තොරව සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති නිරීක්ෂණ සත්‍යවන අතර, පොම්පාගාරයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොවිඩ් 19 වසංගත තත්ත්වය මත අවලංගු වී ඇත. කොන්ත්‍රාත්කරු විසින් පොම්ප සවිකර දීමට එකඟ වී ඇති අතර ප්‍රජා මූළ සංවිධාන වෙත පමණක් පොම්ප ලබා දීමට කටයුතු කරයි. | දෙපාර්තමේන්තුව විසින් ජලසම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් මිලදීගන්නා උපකරණ ආරක්ෂිත පරිදි තබාගැනිමට හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු අතර වියදම් පිළිබද තහවුරුවකින් තොරව ගෙවීම් කල නිලධාරීන් පිළිබඳ අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුයි. |

## 3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මාර්තු 22 දින නිකුත් කරන ලද අංක WAS/A/DNCWS/2022/AQ-04 දරන විගණන විමසුමට විගණන දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා පිළිතුරු ලබා දී නොතිබුණි. | ගම්පහ දිස්ත්‍රික්කයේ අසුපිනි ප්‍රජා ජල ව්‍යාපෘතිය පරීක්ෂාවට පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී ඇත්තේ පරීක්ෂණයක් පැවැත්වෙන බැවිනි. එම පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසුව එම විගණන පරීක්ෂණයට පිළිතුර ඉදිරිපත් කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන කෙරෙහි කළමනාකරන අවධා නය යොමුවිය යුතුය. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ( අ) | දෙපාර්තමේන්තුව විසින් කල්බදු පහසුකම යටතේ මිලදී ගන්නා ලද මෝටර් රථ 07 හි වටිනාකම විධිමත් පරිදි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරනු වෙනුවට වටිනාකම රු.36,800,000 ක් ලෙස, යාන්ත්‍රික ඉංජිනේරුවරයකු දැන්වූ බවට අධ්‍යක්ෂ පාලන විසින් ලබාදුන් ලිඛිත තහවුරුවක් මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම මෝටර් රථ 07 හි තක්සේරු වටිනාකම ලෙස රු.36,800,000 ක් බවට කලින් ඉදිරිපත් කර තිබූ වාර්තා අනුව තහවුරු වන බැවින් ඒ අනුව කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | භාවිතා කරනු ලබන වෙනත් ආයතනවලට අයත් වත්කම් විධිමත් පරිදි පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතුය. |
| (ආ) | 2020-2022 කාලපරිච්ඡේදය තුල දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ජලසම්පාදන ව්‍යාපෘති 160 ක පිරිවැය එකතුව රු.1,180,611,356 ක් වූ ඉදිකිරීම් කටයුතු පෞද්ගලික කොන්ත්‍රාත් ආයතන 41 ක් වෙත පිරිනමා තිබුණු බව විගණනයේදී අනාවරණය වූ අතර විගණිත දිනය වූ 2023 මාර්තු 29 දින වනවිට ඉන් කොන්ත්‍රාත් 04 ක පමනක් වැඩ නිමකර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත්වලට අදාලව කොන්ත්‍රාත් ලේඛනයක් යාවත්කාලිනකර පවත්වා නොගැනීම හේතුවෙන් පසුගිය කාලපරිච්ඡේදය තුල ක්‍රියාත්මක කරන | 2021 සහ 2022 වර්ෂ තුළදී රටතුළ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය මිළ ගණන් ඉහළ යාම, භාණ්ඩ හිඟය සහ ආර්ථික අර්බුද තත්ත්වය මත ඉදිකිරීම් කර්මාන්තයේ සිදුවූ බලපෑම නිසා මෙම ප්‍රමාදයන් සිදුවී ඇති අතර, දැනට මෙම කොන්ත්‍රාත් වලින් සියයට 70 ක වැඩි ප්‍රමාණයක වැඩ අවසන් වී ඇති අතර, කොන්ත්‍රාත් ලේඛනය මේ වන විට නිසි අයුරින් නඩත්තු කරමින් පවතී. | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සියලුම කොන්ත්‍රාත්වලට අදාල තොරතුරු ඇතුලත් කර කොන්ත්‍රාත් ලේඛණයක් නඩත්තු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලද ජල සම්පාදන යෝජනා ක්‍රමවල සමස්ථ තත්ත්වය වාර්තා කල නොහැකි විය. | | |
| (ඇ ) | 2016 සැප්තැම්බර් 30 දිනැති අංක 04/2016 (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව CIDA හි ලියාපදිංචි වී ඇති C-7 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවෙකු වෙත එකවර ප්‍රදානය කළ හැකි කොන්ත්‍රාත් වැඩවල මූල්‍ය සීමාව රු.මිලියන 05 ත් 10 ත් අතර වුවත් නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදි කිරීමට නියමිතව තිබූ පිරිවැය එකතුව රු.24,736,088 ක් වූ කොන්ත්‍රාත් කාර්යයන් 05 ක් එකම කාලසීමාවක් තුලදී අනුමත සීමාව රු.14,736,088 ක් ඉක්මවා ඉටු කිරීමට පුද්ගලික කොන්ත්‍රාත් ආයතනයකටද අනුරාධපුර දිස්ත්‍රික්කයේ, එකතුව රු.59,274,662 ක ජල ව්‍යාපෘති 4 ක කොන්ත්‍රාත්තු එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙතද ප්‍රදානය කර තිබුණු බව විගණන පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි. මෙම වාර්තාවේ 3.2, 3.3, 3.4 ඡේදවල විස්තර කර ඇති පරිදි අදාල කොන්ත්‍රාත් නිමකිරීම අසාමාන්‍ය ලෙස ප්‍රමාදවීමට සහ නිසි ප්‍රමිතියකින් යුතුව කොන්ත්‍රාත් නිම නොකිරීමට මෙම තත්වයද ඍජු ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | 2016.09.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව CIDA කොන්ත්‍රාත්කරුවකු සඳහා අදාළ මූල්‍ය සීමාව තුළ ඇති කොන්ත්‍රාත් වැඩ් ගණනක් එකම කොන්ත්‍රාත් කරුවකුට පිරිනැමීම කළ නොහැකි බව දක්වා නොමැත. එක් කොන්ත්‍රාත් පමණක් ලබාගෙන ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ පවා වැඩ ප්‍රමාද වී ඇත. මේ අනුව 2021 හා 2022 වර්ෂ තුළදී රටතුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය අමුද්‍රව්‍ය මිළ ගණන් ඉහළ යාම භාණ්ඩ හිඟය සහ ආර්ථික අර්බුධ තත්ත්ව මත ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ පසුබෑම් නිසා මෙම ප්‍රමාදයන් සිදු වී ඇත. | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම වලට අදාල කොන්ත්‍රාත් පරිපාලනයේ පවතින මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සහ සමාලෝචිත වර්ෂයේ විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ ජල සම්පාදන ව්‍යාපෘතිවලට අදාලව විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් මත කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම, ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා අධික මිලට කොන්ත්‍රාත් පිරිනැමීම,නොකල වැඩ සඳහා ගෙවීම් කිරීම, කොන්ත්‍රාත් නිසිපරිදි අධීක්ෂණය නොකිරීම, නිසිපරිදි ලේඛණ පවත්වාගෙන නොයාම, කොන්ත්‍රාත් අතරමග අත්හැර දැමීම පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවීම පිළිබඳ පසුවිපරම් නොකිරීම වැනි කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් | විගණන නිරීක්ෂණ වලට අදාල පැහැදිලි කිරීම් සිදුකර නොමැත. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ගේ අවධානය යොමුකර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුකර ගැනීමට හැකි වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූ පොදු අඩුපාඩු පිළිබඳ විගණන වාර්තා මගින් කළමණාකරණය දැනුවත් කර තිබුණද එම තත්ත්වය නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | | |
| (ඉ) | “ප්‍රජා ජල අභිමානී” මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට පෙර ප්‍රසම්පාදන අස්තිත්වය විසින් ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මතක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු කරුණු ඉටුකර ඇති බව සනාථ කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද විගණන නියැදි පරික්ෂාවට භාජනය වූ මඩකලපුව හා අනුරාධපුර දිස්ත්‍රික් වල ජල ව්‍යාපෘති 07 කට අදාල ඉදිකිරීම් භූමි අත්පත් කර ගෙන නොතිබුණි. | මේ දක්වා ක්‍රියාත්මක කර ඇති කිසිදු ප්‍රජා ජල ව්‍යාපෘතියක ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කර නොමැති අතර එම සියලුම ඉඩම් රජයට අයත් ඉඩම් හෝ පෞද්ගලික හිමිකරුවන්ගෙන් ප්‍රදාන වශයෙන් ලබා ගෙන ඇත. ඉඩම් අත්පත් කර ගැනීමට යාමේදී අමතර වැය බරක් රජයට දැරීමට සිදුවන නිසා ඉඩම් අත්පත් කර ගැනීමකින් තොරව අදාල අවසර ලබා ගැනීමෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. | පිළිතුරෙහි සඳහන් පරිදි සියලුම ඉඩම් රජයට අයත් හෝ පෞද්ගලික ප්‍රදාන ලෙස ලැබී තිබේ නම් පිරිවැයකින් තොරව විධිමත් පරිදි පවරාගැනීමට බාධාවක් නොවන බව කළමණාකරන අවධානයට යොමුවිය යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි අංක 128 (අ, ආ) සහ 133 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගගේ රාජකාරි හා වගකීම ඉටුකිරීමෙ දී ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතු අතර ජාතික විගණන පනතේ 41 වගන්තියෙහි ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතුයි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන තනතුර අනුමත කර තිබුණද, එම තනතුරට අදාල බඳවා ගැනීම් | අභ්‍යන්තර විගණක 11/111 ශ්‍රේණියේ තනතුරක් අනුමත කර ඇති අතර, අභ්‍යන්තර විගණක තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ ගණකාධිකාරි II/III ශ්‍රේණියේ නිලධාරියකු පත් කර ගැනීම සඳහා ලිපි මඟින් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.<br><br>අභ්‍යන්තර විගණන තනතුර සඳහා ගණකාධිකාරි I ශ්‍රේණියේ තනතුරක් ලෙස සංශෝධනය කර දෙන ලෙස | ජාතික විගණන පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සිදුකර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ වගකීම් ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කෝාට එය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2023.01.30 දින ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත | |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 15 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 23 ක පමණ ප්‍රතිශතයක් විය. කෙසේ වුවද සේවකයින් 72 ක අතිරික්තයක්ද නිරීක්ෂණය වූ අතර සේවක කළමනාකරණයේ ඉතාම දුර්වල තත්වයක් මේ තුලින් නිරීක්ෂණය විය. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා නිලධාරින් අනුයුක්ත කර ගැනීමට රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට ලිපි යොමු කර ඇත. නව පත්වීම් ලබා දෙන ලද සංවර්ධන නිලධාරින් දෙපාර්තමේන්තුවට අනුයුත්ත කිරිමත් සමඟ නිලධාරින් 55 දෙනෙකුගේ අතිරික්තයක් ඇතිව තිබේ. එම නිලධාරින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.අනෙකුත් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන කාර්යමණ්ඩලය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |